**ශීර්ෂය 122 – පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 122 – පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 නොවැම්බර් 15 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

2.1 **විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,526.30 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,378.79 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,147.51 ක් හෙවත් සියයට 60.90 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,114.80 | 1,055.12 | 59.68 | 5.35 |
| ප්‍රාග්ධන | 2,411.50 | 323.67 | 2,087.83 | 86.58 |
| **එකතුව** | **3,526.30** | **1,378.79** | **2,147.51** | **60.90** |

**2 .2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 12201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15.00 | 14.76 | 5.00 | 15.57 | 45.00 | 20.58 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 80.08 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 106.09 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0166/000 | 0.005 |
| 6000/0000/00/0013/0121/000 | 105.604 |
| 6000/0000/00/0016/0111/000 | 0.421 |
| 6000/0000/00/0020/0018/000 | 0.061 |
| එකතුව | **106.091** |

**2.5 විගණන නිරීක්ෂණය**

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | පුද්ගල පඩිනඩි ලේඛණය | මුදල් රෙගුලාසි 453 | පවත්වා නොතිබුණි. |
| (ii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (iii) | අතිරේක ඉන්ධන ලේඛනය | 2008 ජූනි 26 දිනැති අංක 13/2008 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | පවත්වා නොතිබුණි |
| (iv) | සුළු මුදල් ලේඛනය | මුදල් රෙගුලාසි 446 | පවත්වා නොතිබුණි |
| (v) | උප පත්‍රිකා ලේඛනය | මුදල් රෙගුලාසි 454(1) | පවත්වා නොතිබුණි |
| (vi) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (vii) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (viii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විගණන සාක්ෂි නොවීම

හිටපු අමාත්‍යවරයෙකුට හා අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරු දෙදෙනෙකු විසින් ලබා ගෙන තිබුණු එකතුව රු.433,575 ක් වටිනා ජංගම දුරකථන 05 ක්ද, අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකු විසින් ලබා ගෙන තිබුණු රු.8,000 ක් වටිනා car charges 03 ක් ආපසු අමාත්‍යාංශ වෙත භාර දුන් බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. අමාත්‍යවරයාගේ නිල නිවස සඳහා මිලදී ගෙන තිබුණු රු.3,355,520 ක් වටිනා ලිබඩු උපකරණ හා ශබ්ද පරිපාලන පද්ධතිය සවිකළ බවට හෝ ඒවා භාරගත් බවට වගකිව යුතු නිලධාරියෙකු සනාථ කළ තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදි ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට හා ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 03 කට 2016 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 25,133,352 ක් වී තිබුණි.

## 3.4 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 10 කට සලසා තිබූ රු.951,950,000 ක ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි කර තිබුණි. රාජ්‍ය මාධ්‍ය සම්මාන උළෙලක් පැවැත්වීම සඳහා සලසා තිබූ රු.10,000,000ක ප්‍රතිපාදන අදාළ කාර්යය ඉටු කිරිම සඳහා කටයුතු නොකර එම ප්‍රතිපාදනයෙන් රු.9,400,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ආ) වැය විෂයයන් 42 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 26 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.5 අග්‍රිම ගිණුම්

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 10 කට අවස්ථා 90 කදී එකතුව රු.796,395 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

## 3.6 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් ඉදිරි වර්ෂයේදී වැය කිරිමට අපේක්ෂාවෙන් 2010 වර්ෂයේදී වැය ගිණුමට හර කර එය තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම තැන්පත් ශේෂය රු.1,266,697 ක් වී තිබුණත්, එය නිරවුල් කිරිමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 ඔක්තෝබර් 23 දිනැති අංක බීඩී/356/280/3/එස් දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම් ගේ ලිපිය අනුව විදේශිය ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වෙළඳ දැන්වීම් වෙනුවෙන් අයකරනු ලබන බදු ආදායම්, භාර අරමුදලක් පිහිටුවන තෙක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමටත් අනුමැතිය ලබා දි තිබුණි. 2009 නොවැම්බර් 04 දින අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව එම බදු ආදායම් තැන්පත් ගිණුමකට බැර කර රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ ඉදිකිරීම් හා ඊට අනුෂාංගික කටයුතු සඳහා යෙදවීමටත් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දින වන විට තැන්පත් ගිණුමේ රු.102,141,007 ක් ශේෂයක් හා භාණ්ඩාගාර බිල්පත්වල රු.378,400,000 ක් ආයෝජනය කර තිබුණි. නමුත් 2016 අප්‍රේල් 30 දින වන විටත් ඉහත සඳහන් භාර අරමුදල පිහිටුවා නොතිබුණි.

## 3.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 12201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.544,899 ක්වූ අතර, එම හිඟහිටි ශේෂයෙන් රු.59,380 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අය කර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1:1:6 ඡේදය ප්‍රකාරව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 ක් ඇතුළත නිරවුල් කර ගත යුතුව තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන මාරු වී ගිය මාස 3 කට වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවැත එමින් තිබුණු නිලධාරීන් 4 දෙනෙකුගේ එකතුව රු.463,196 ක් වූ ණය ශේෂ 2016 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.8 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.8.1 විගණන හා කළමනාකරණ කමිටුව**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය ඇතුළු ඒ යටතේ තිබෙන ආයතන 13 ක් සඳහා පැවැත්විය යුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 52 ක් වෙනුවට රැස්වීම් 18 ක් පමණක් පවත්වා තිබුණි.

**3.8.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, එම වාර්තාව 2016 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.9 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අමාත්‍යාංශයේ වාහන 04 ක් වර්ෂ දෙකක පමණ කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2016 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2014 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) ලැබිය යුතු ශේෂ**

2006 මාර්තු 31 දිනැති රජයේ ගැසට් පත්‍රයේ දෙවන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලද 2006 අංක 11 දරන මුදල් පනතේ 7 වගන්තියට අනුකූලව රූපවාහිනී නාලිකා 02 ක් සම්බන්ධයෙන් ආනයනික චිත්‍රපට, ටෙලිනාට්‍ය හා වාණිජ වැඩ සටහන් වෙනුවෙන් පසුගිය වර්ෂ 6 ක් සඳහා 2015 දෙසැම්බර් 31 වන විට අයකළ යුතු රු. 32,099,978 ක බදු ආදායම අයකරගෙන නොතිබුණි.

**3.10 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| **(i)** | මුදල් රෙගුලාසි 104(1)(අ) | 3,347,577 | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ii)** | මුදල් රෙගුලාසි 1646 | - | රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ දෛනික රාජකාරි අවශ්‍යතා සඳහා ලබාදී තිබූ වාහන 2 ක් හැර අනෙක් වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන චක්‍රලේඛය | - | චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යවරයාට හිමි වාහන 03 ට අමතරව අමාත්‍යාංශයේ වාහන 06 ක් ද, නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් චක්‍රලේඛ ප්‍රකාරව හිමි වාහන 03 ට අමතරව ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාහනයක් ද පරිහරණයට ගෙන තිබුණි. |
| **(ii)** | 2015 ජූලි 17 දිනැති අංක සීඑස්ඒ/1/1/92 දරන චක්‍රලේඛයේ | - | ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් වාහන 04 ක්ද, නියෝජ්‍ය අමාත්‍යවරයා (2015 ජූනි මාසයට පෙර සිටි) විසින් වාහන 02 ක් 2015 මහ මැතිවරණයේදී සිය පක්ෂයේ හෝ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීම වෙනුවෙන් වාහනයක් වෙනුවෙන් මසකට රු.100,000 ක මුදලක් ගෙවිය යුතු වුවත්, එසේ එම මුදල් ගෙවා නොතිබුණි. |
| **(iii)** | 2015 ජූලි 17 දිනැති අංක සීඑස්ඒ/1/1/92 චක්‍රලේඛයේ (1) ඡේදය මගින් සංශෝධනය කරන ලද 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන චක්‍රලේඛයේ 3.4 ඡේදය | - | අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට ලබා දී තිබුණු වාහන 05 ක් අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශය වෙත භාර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි. |

**3.11 විදේශාධාර/දේශීය ණය ව්‍යාපෘති**

**ව්‍යාපෘතිවල කාර්යසාධනය**

ශ්‍රී ලංකා රජයේ හා ජපන් රජයේ ණය ආධාර (JICA Loan) යටතේ 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබූ භෞමික රූපවාහිනී විකාශන කටයුතු වෙනුවෙන් අංකන තාක්ෂණය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. විදේශීය ණය රු.මිලියන 950 ක් හා විදේශීය මූලායන ආශ්‍රිත දේශීය පිරිවැය රු. මිලියන 950 ක් වශයෙන් රු.මිලියන 1900 ක ප්‍රතිපාදන

සළසා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී එකී ව්‍යාපෘතිය අත්හිටුවා තිබූ අතර, දේශීය පිරිවැය යටතේ වූ රු.මිලියන 2.7 ක් ව්‍යාපෘතිය සඳහා අවිධිමත් ලෙස පත්කරන ලද කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීමට වැය කර තිබුණි. එම කාර්ය මණ්ඩලය පත්කිරීමද අවිධිමත්ව සිදුකර තිබුණි.

## 3.12 කාර්යසාධනය

----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

------------------------------------------------

අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) රූපවාහිනී විකාශනය හා සිනමාව සඳහා අංකන තාක්ෂණය හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.

(ii) රන්මිහිතැන්න ජාතික ටෙලිසිනමා උද්‍යාන පදනම පනත බලාත්මක කර නොතිබුණි.

(iii) කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් 36 ක් පැවැත්විය යුතු වුවද , රැස්වීම් 11 ක් පමණක් පවත්වා තිබුණි.

### (ආ) කාමර පහසුකම් සැපයීම

-------------------------

රන්මිහිතැන්න ටෙලිසිනමා ගම්මානයේ රූ ගත කිරීමට සහභාගී වන අයට කාමර පහසුකම් සැපයීමට ඒ,බී හා සී ශ්‍රේණියේ කාමර වර්ග 03 ක් යටතේ කාමර 43 ක් ඉදිකර තිබුණත් වර්ෂය තුළදී ඒවායේ උපයෝජනය පිළිවෙලින් සියයට 06, සියයට 07 හා සියයට 15 ක් වී තිබුණි.

### (ඇ) සැලැසුම් කිරීම

-----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළදී නිම කිරීමට යෝජිතව තිබුණු පහත සඳහන් කරුණු ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි.

(i) සැලසිනේ ආයතනය රාජ්‍ය සමාගමක් ලෙස පිහිටුවීම

(ii) ජාතික විකාශන සංවර්ධන අධිකාරිය පිහිටුවීම

(iii) ආර්ථික, සමාජ හා සංස්කෘතික කටයුතුවලට අදාළ වැදගත් තොරතුරු පුවත්පත් වලින් එක්රැස් කිරීම

(iv) ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හා ඊට සම්බන්ධ ආයතන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.13 **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අංශය විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | |
| | | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 200,788 | - | 200,788 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් | 419,836 | 433,942 | 853,778 |
| (iii) | හඳුනා නොගත් හර | 5,000,000 | - | 5,000,000 |
| (iv) | හඳුනා නොගත් බැර | 3,180,422 | | 3,180,422 |

**3.14 අවිධිමත් ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ලබාදීමට CDMA දුරකථන 80 ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට රු.102,000 ක් ගෙවා තිබුණි. එම කාර්යය දේශපාලන සංවිධාන මගින් සිදු කිරීමට කටයුතු සංවිධානය කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර, දුරකථන ලබාදීමට ප්‍රතිපාදන සලසන ආකාරය හා අදාළ අනුමැතිය ආදී තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් කරන ලද ලිපිගොනුවේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) විධිමත් බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කර ගැනීමකින් තොරව, 2015 මැයි 05 දින සිට රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්කර තිබු නිලධාරියෙකු සේවයට වාර්තාකළ බව තහවුරු කර ගැනීමෙන් තොරව එම දිනයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා වැටුප් හා අනෙකුත් දීමනා වශයෙන් රු.339,874 ක් ගෙවා තිබුණි.

(ඇ) අමාත්‍යවරයාගේ ධූර කාලයට පමණක් වලංගු වන පරිදි සහකාර ලේකම් (කම්කරු සබඳතා - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන ) තනතුරට පත්කර සිටි නිලධාරියාට අමාත්‍යවරයාගේ ධූරය අහෝසි වී තිබුණු 2015 අගොස්තු 17 දින සිට 2015 නොවැම්බර් 02 දින දක්වා වූ කාල සීමාවට අදාළව වැටුප් හා දීමනා වශයෙන් රු.117,241 ක් ගෙවා තිබුණි. නිලධාරියා එම කාලපරිච්ඡේදය තුළ සේවයට වාර්තා කළ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව එම නිලධාරියාට ගෙවා තිබුණු වැටුප් හා දීමනා ආපසු අයකර ගත යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.33,110 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ඇ) 2015 ජනවාරි මාසය දක්වා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ හා ඉන් අනතුරුව පත්වූ ලේකම්වරයාගේ පෞද්ගලික ලේකම්වරිය විසින් කොළඹින් බැහැර රාජකාරිවල නිරත වීම වෙනුවෙන් අවස්ථා 21 දී රු.199,320 ක් ලබාගෙන තිබුණි. එම නිලධාරිනියට පැවරී තිබූ රාජකාරි පිළිබඳ විස්තර හෝ ඉටු කරන ලද රාජකාරි තහවුරු කිරීමට අදාල සාක්ෂි කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

**3.15 අනාර්ථික ගනුදෙනු**

----------------------

මාධ්‍යවේදීන්ට තීරුබදු රහිතව යතුරුපැදි ලබාදීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පලකිරීම හා සම්මුඛ පරීක්ෂණ වියදම් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.844,933 ක් වැය කර තිබූ නමුත් 2016 මැයි 31 දින වන විටත් යතුරුපැදි ලබාදීම සිදුකර නොතිබුණි.

**3.16 පාඩු හා හානි**

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ බදු අංශය විසින් නියමිත බදු මුදල් ගෙවීමකින් තොරව ආනයනික වෙළඳ දැන්වීම් ප්‍රචාරය වන්නේද යන්න පිළිබඳ පසු විපරම් කිරීමක් සිදු කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් 2013 හා 2014 වර්ෂවලදී නියැදියක් පරීක්ෂා කිරීමේදී පිළිවෙලින් රු.2,500,000 ක් හා රු.3,000,000 ක බදු මුදල් අයකර ගෙන නොතිබුණි. 2015 වර්ෂයේදී සිදු කළ එම පරීක්ෂාවේදී ආනයනික වෙළඳ දැන්වීම් 20 කින් පමණක් රජයට සිදුවී තිබූ පාඩුව රු.10,000,000 ක් වී තිබුණි. බදු අංශය විසින් මේ පිළිබඳව අවධානය යොමු නොකිරීම නිසා වාර්ෂිකව රජයට විශාල ආදායමක් අහිමි වන බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ ප්‍රවේශපත් අලෙවිය, රූ ගතකිරීම, කාමර පහසුකම් සැලසීම හා වෙනත් ආදායම්වල එකතුව රු.12,705,277 ක් වූ අතර එහි නඩත්තු හා අනෙකුත් කාර්යයන්ට අදාළ වියදම රු.20,299,830 ක් වූයෙන් වර්ෂයේ පාඩුව රු.7,594,553 ක් වී තිබුණි..

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතියක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ පළමු අදියර වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ රු.33,969,725 ක් වූ අවසන් බිල්පතට අනුව රු.9,994,476 ක් වැඩිපුර මුදලක් දක්වා තිබුණි. ඒ අනුව ගෙවිය යුතු මුදල රු.23,975,249 ක් වුවද, අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරු වෙත රු.25,000,000 ක් ගෙවා තිබීම නිසා රු. 1,024,751 ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ බව අනාවරණය විය.

**3.17 විසඳා නොතිබුණු විගණන ඡේද**

----------------------------------

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දක්වා ඇත.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2012 | 8(ආ)(ii) | මහින්ද රාජපක්ෂ ටෙලිසිනමා උද්‍යානය සඳහා වෙනම පනතක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම සඳහා කටයුතු කිරීමට 2012 |

| | | |
|---|---|---|
| | | වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ දක්වා තිබුණත්, එම පනත 2016 මැයි 31 දින වන විටත් සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2012 | 12(අ) | රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානය සඳහා නිකුත් කළ ප්‍රවේශ පත්‍ර හා ලබා ගත් ආදායම අතර පැවැති රු.99,305 ක ඌනතාවය සම්බන්ධයෙන් 2016 මැයි 31 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 2012 | 1.12(ඒ) | 2012 වර්ෂයේදී නිම කිරීමට යෝජිත ජනමාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය 2016 මැයි 31 දින වන විටත් නිම කර නොතිබුණි. |
| 2012 | 1.13(ඇ) | ගුවන් විදුලි සහ රූපවාහිණී නාලිකා පවත්වා ගැනීමට බලපත්‍ර නිකුත් කිරීමේදී, ස්ථිර බලපත්‍ර වෙනුවට තාවකාලික බලපත්‍ර නිකුත් කර තිබුණි. ස්ථිර බලපත්‍රයක් නිකුත් කිරීමට හෝ අළුත් කිරීමේ ක්‍රමයක් 2016 මැයි 31 දින වන විටත් සකස් කර නොතිබුණි. |
| 2013 | 5.11(ආ) | 2016 අංක 11 දරන මුදල් පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලාංකික ගතිසිරිත් වර්ධනය කිරීම පිණිස විදෙස් රටවල නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන් මෙරට විකාශනය කිරීම වෙනුවෙන් බද්දක් පනවා තිබුණි. බලපත්‍ර 15 ක් යටතේ ක්‍රියාත්මක වූ කේබල්, චන්ද්‍රිකා, අන්තර්ජාලය හා දුරකථන මත පදනම් වූ රූපවාහිණී නාලිකා තුළින් විකාශනය වූ වැඩසටහන් මෙම බද්දට යටත් නොවන බැවින් අදාළ බද්ද පැනවීමේ පරමාර්ථය මෙරට තුළ ඉටු වී නොතිබුණි. |
| 2014 | 3.16(අ) | කේබල් රූපවාහිණිය සඳහා බලපත්‍ර 2012 වර්ෂයේදී ලබාගත් ආයතනයක් නීති විරෝධී ආකාරයට කටයුතු කර තිබෙන බව 2013 වර්ෂයේදී තහවුරු වී තිබුණි. අමාත්‍යාංශය විසින් එම ආයතනය සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. පාර්ලිමේන්තුවේ කාරක සභා නියෝගයක් අනුව කේබල් චන්ද්‍රිකා හා අන්තර් ජාලය මත පදනම් වූ රූපවාහිණී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්ති ඇති නොකර 2014 නොවැම්බර් මාසයේදී චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ රූපවාහිණී ජාලයක් පවත්වා ගැනීම සඳහා බලපත්‍රයක් ලබා දී තිබුණි. |

**3.18 රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබුණු නියෝග ක්‍රියාත්මක නොකිරීම**

අමාත්‍යාංශයට අදාළව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2014 ජනවාරි 22 දින ලබාදුන් නියෝග අතරින් 2016 මැයි 31 දින වන විටත් ක්‍රියාත්මක නොකළ නියෝග පහත දැක්වේ.

| රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් ඡේදයට යොමුව | යොමුගත විෂය |
|---|---|
| 05 | විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහාද පැමිණිලි කළ හැකි පරිදි ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිෂන් පනත සංශෝධනය කිරීම. |

| | |
|---|---|
| 07 හා 08 | විකාශන සංවර්ධන අධිකාරී පනත සම්මත කිරිම හා පිහිටුවිම, අංකන තාක්ෂණය හඳුන්වාදීම හා ප්‍රගති පිළිබඳ කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කිරිම. |
| 12 | රාජ්‍ය මුදල් අයථා ලෙස පුද්ගලික පාර්ශවයන් වෙත යෑම වැලැක්වීමට පෞද්ගලික ගුවන් විදුලි නාලිකා හා රූපවාහිණී නාලිකා බලපත්‍රලාභින්ගේ ක්‍රියාකාරකම් අධික්ෂණය, වාර්ෂිකව ගාස්තු අයකිරිම හා බලපත්‍ර අළුත් කිරිම සඳහා නියමිත ක්‍රමවේදයක් ඇති කිරිම. |
| 13 | බලපත්‍රලාභින්ගෙන් නිවැරදි තොරතුරු සමාගම් රෙජිස්ට්‍රාර්ගෙන් ලබාගෙන කමිටුවට වාර්තා කිරිම හා කේබල් චන්ද්‍රිකා හා අන්තර්ජාලය මත පදනම් වූ රූපවාහිණී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ඇති කිරිම. |
| 15 | 2009, 2010 වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිම. |
| 20 | 2010 වර්ෂයේ කළ වියදම් වෙනුවෙන් අනුමැතිය ලබා ගැනිමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරිම |
| 26 | ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් ඇති කිරිම හා රූපවාහිණී ප්‍රචාරණ දැන්විම් පාලනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇති අතර ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනිම. |

**3.19 කළමනාකරණ දුර්වලතා**

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් මාසයේදී රු. 648,312 ක් වැයකර ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳව “FRONTIER” නමින් සඟරා පිටපත් 1,000 ක් මුද්‍රණය කර තිබූ අතර, ඒවා ලේඛණගත කිරීමක් සිදුකර නොතිබුණි. 2016 මැයි මාසයේ සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එම සඟරා බෙදා නොහැර අබලි ද්‍රව්‍ය ගබඩාවේ ගොඩගසා දිරාපත් වෙමින් පැවැතුණි..

(ආ) 2015 ජුලි 20 දින සිට රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ ආරක්ෂක කටයුතු භාර දී තිබූ සමාගම වෙත එදින සිට 2015 දෙසැම්බර් 31 දක්වා රු. 1,162,023 ක් ගෙවා තිබූ නමුත්, අදාළ සමාගම ගිවිසුම් කෙටුම්පත ප්‍රකාරව කටයුතු කර නොතිබූණි.

(ඇ) රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ කළමනාකරු (සංවර්ධන හා මෙහෙයුම්) තනතුරේ වැඩ බැලීම සඳහා අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියෙකු 2014 අප්‍රේල් 03 දින සිට පත්කර තිබුණි. එම නිලධාරියා පවත්නා නීති, රීතිවලට පටහැනිව රු.100,000 ක දීමනාවක්, අවස්ථා 10 ක් සඳහා 1/20 දීමනා රු.29,425 ක්, සංග්‍රහ වියදම් අත්තිකාරම් ලෙස ලබාගෙන ඇති මුදලින් ආහාර පාන වෙනුවෙන් අවස්ථා 08 කදී රු.130,574 ක් හා ඉන්ධන වියදම් සඳහා රු.121,108 ක් වශයෙන් එකතුව රු. 381,107 ක් ලබාගෙන තිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ(මාධ්‍ය) තනතුරෙහි ස්ථිර කර නොතිබුණු නිලධාරියෙකුට, 2013 අගෝස්තු 02 දිනැති අංක 01/2013 දරන වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ නියමයන්ට පටහැනිව විධායක තනතුරක වසර 6 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ නැති නිලධාරියෙකුට සහනදායී මෝටර් රථ බලපත්‍රයක් 2015 සැප්තැම්බර් 03 දින ලබාදී තිබුණි. මූලික අවශ්‍යතා සපුරා නොතිබියදීත් මෙම නිළධාරියාට සහනදායී මෝටර් රථ බලපත්‍රයක් ලබාදීම තුළින් රජයට බදු ආදායම් ලෙස ලැබිය යුතු රු.2,271,732 ක මුදලක් අහිමි වී තිබුණි.

(ඉ) 2006 ජූනි 29 දිනැති ගැසට්පත්‍රය මගින් කළ සංශෝධනයේ නියෝග 04 ප්‍රකාරව ආනයනික ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් විකාශනය කිරීමට අනුමැතිය ලබාගැනීමට පත්කළ සමීක්ෂණ මණ්ඩලයේ සම්පත්ධාරීන් චිත්‍රපට, රූපවාහිනිය, සාහිත්‍ය, භාෂාව, විද්‍යාව, ඉතිහාසය, මනෝවිද්‍යාව හා නීතිය වැනි ක්ෂේත්‍රයන් පිළිබඳ නිපුණතාවයන්ගෙන් යුක්ත වියයුතු බව සඳහන් කර තිබුණද, 2015 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩලයේ සිටි සාමාජිකයන්ගෙන් ඉහත ක්ෂේත්‍ර අනාවරණය නොවන බවත්, මාධ්‍යවේදීන්, සාහිත්‍යවේදීන් හා චිත්‍රපට විචාරක යන ක්ෂේත්‍රවලට අදාල නිලධාරීන්ට පමණක් සීමා වී තිබුණු බවත් නිරීක්ෂණය විය.

## 3.20 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 18 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 111 | 105 | 06 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 50 | 43 | 07 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) – ජනමාධ්‍ය | 30 | 40 | - | 10 |
| | - පාර්ලිමේන්තු කටයුතු | 1,015 | 1,015 | - | - |
| | **එකතුව** | **1,233** | **1,222** | **21** | **10** |